**විසර්ජන ශීර්ෂය 122 - ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස **-** අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

1 කොටස

**ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| විසර්ජන ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
| --- | --- |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,614,025,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.3,018,126,727 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.1,952,641 ක සිට රු.309,647,107 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.02 ක සිට සියයට 18.91 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 122 | 1,637,000,000 | 1,327,352,893 | 309,647,107 | 18.92 |
| 210 | 191,050,000 | 189,097,359 | 1,952,641 | 1.02 |
| 211 | 1,785,975,000 | 1,501,676,475 | 284,298,525 | 15.9 |
| **එකතුව** | **3,614,025,000** | **3,018,126,727** | **595,898,273** | **16.49** |

## 2.2 ආදායම් ගිණුම්

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය යටතේ ඇති රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 2003-02-05 සඳහා රු. මිලියන 300 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 469.54 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 156 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු. | රු. | රු. | |
| 2003-02-05 | 300,000,000 | 469,540,080 | 169,540,080 | 56.5 |

2.3 අත්තිකාරම් ගිණුම්

----------------------

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

--------------------------------------------

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

--------------------------------------------------

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 2 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තත්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12201 | 6,000,000 | 3,587,086 | 3,300,000 | 3,516,767 | 22,000,000 | 12,681,737 |
| 21001 | 8,000,000 | 7,367,705 | 5,000,000 | 6,263,249 | 46,000,000 | 28,012,685 |
| 21101 | 55,000,000 | 39,534,900 | 38,000,000 | 50,724,669 | 300,000,000 | 225,625,534 |

2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

-----------------------------------

2.4.1 අග්‍රිම ගිණුම්

--------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 9,890,415 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. |
|---|---|---|
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 7002/0000/00/0143/0013/000 | 1,816,275 |
| රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 7002/0000/00/0246/0013/000 | 4,340,660 |

| | | |
|---|---|---|
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0104/0013/000 | 3,733,480 |

2.4.2 පොදු තැන්පත් ගිණුම්

------------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 140,956,686 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. |
|---|---|---|
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 6000/0000/00/0015/0035 | 74,187,167 |
| රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0092 | 14,959,346 |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0092 | 51,751,173 |
| | 6000/0000/00/0002/0004 | 59,000 |

2 කොටස

එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

---------------------------------------------------

1. ශීර්ෂය 122 - ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

----------------------------------------------------------

1.1 විගණන විෂය පථය

------------------------

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා ,සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 27 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්ව ඇත.එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත්

හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳීම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149, 150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

---

2013 දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | හානි පාඩු ලේඛණය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛණය | 1978දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | පුද්ගල පඩිනඩි ලේඛණය | 2010 පෙබරවාරි 19 දිනැති අංක ඩීඑම්ජ් /2010 (4) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 453 (2) |

(iv) බැරකම් ලේඛණය මුදල් රෙගුලාසි 211

(ආ) විගණන සාක්ෂි නොවීම

---------------------------

තොරතුරු ඉදිරිපත් නොකිරීම

--------------------------------

i. මහනුවර අධ්‍යාපන කොට්ඨාශය තුල පිහිටි පාසල් මාධ්‍ය කව විධිමත් කිරීමේ සම්මන්ත්‍රණය සදහා රු. 196,500 ක් වැය කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් වූ ඇස්තමේන්තුවක් හා සැලසුමක් විගණනයට ඉදිරිපත් නොවුණි.

ii. 2013 ජනවාරි 10 දින හා 2013 දෙසැම්බර් 27 දින පවත්වනු ලැබූ මාධ්‍ය සුහද හමු සදහා රු. 7,168,650 ක් ආහාරපාන වෙනුවෙන් වැය කර තිබූ අතර ආරාධිතයන් හා සහභාගී වූවන් පිළිබද සනාථ කරන ලියවිලි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) විගණන විමසුම් වලට පිළිතුරු දීම

--------- --------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම්05 කට 2014 දෙසැම්බර් 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එම විමසුම් වලට අදාල ගණනය කළහැකි ගණුදෙනුවලට අදාල වටිනාකම රු. 203,945,045 ක් විය.

(ඈ) අයවැය විචලනය

-------------------

(i) වැය විෂයයන් 02 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.200,000ක් වූ සම්පූර්ණ මුලධන ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 21 ක එකතුව රු.361,420,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර , එයින් එකතුව රු. 74,104,080 ක් උපයෝජනය කිරීමෙන් පසුව රු.287,315,920 ක ඉතිරියක් නිරීක්ෂණය විය.එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට 99 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. අදාල අරමුණු හා කාර්යයන් සදහා නිසිපරිදි මුදල් වැය නොකිරීම හෝ අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරිවීම් වලට හේතුවූ බව නිරීක්ෂණය විය.

(iii)වැය විෂයයන් 04 ක් යටතේ වෙන්කල රු.2,400,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම හා තවත් වැය විෂයයන් 04 ක් යටතේ වෙන්කල රු. 19,000,000 ක ප්‍රතිපාදනයෙන් සියයට76 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.මේ අනුව අවශ්‍ය ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන සලසාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(iv) 2013 වර්ෂයේ ව්‍යාපෘති දෙකක් සදහා මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව ප්‍රතිපාදන ඉක්මවා රු. 277,997,186 ක බැරකම් වලට බැදී තිබුණි.

(v) වාහන දෙකකට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් වූ අයකර ගත නොහැකි රු. 75,874 ක අලාභ 2012 වර්ෂයේදි ගිණුම් වලින් කපා හැර තිබූ අතර 2013 වර්ෂයේදිද නැවත එම අලාභයම කපා හැර තිබුණි. එක් වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් අයකර ගත නොහැකි රු. 17,891 ක අලාභය කපා හැරීම අනුමත කර හා ප්‍රතිපාදන සලසා තිබුණද ,කපා නොහැර ඉදිරියට ගෙන ගොස් තිබුණි.

(ඉ) අග්‍රිම ගිණුම

-------------

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී දින 19 ක් හා දින 8 ක ප්‍රමාදයකින් පසුව ඉහත අතුරු අග්‍රිමයන් නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත්කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු 20,000 ක් වී තිබුණත්,එම රෙගුලාසි වලට පටහැනිව අවස්ථා 40 ක දී නිලධාරීන් 20 ක් වෙත රු. 20,000 ත් රු. 500,000 ත් අතර පරාසයක එකතුව රු. 3,922,975 ක තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඊ) පොදු තැන්පත් ගිණුම

------------------------

(i) 2013 වර්ෂය සඳහා ආනයනික රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් අයකරගත් මුළු බදු ආදායම රු.88,270,500 ක් වන අතර ඉන් රු. 67,039,456ක් එනම් 76% ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ආයෝජනය නොකොට පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය නොලබා අමාත්‍යාංශය විසින් වැය ගිණුමට 2010 වර්ෂයේදී හර කර තිබුණු එකතුව 1,426,529 ක් වූ මුදල 2012 අගෝස්තු 30 දින පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

--------------------------------------------------------------------

විෂය අංක 12201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 310,274 ක් විය.

(ඌ) උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීම

---------------------------------------------

2013 ජනවාරි 23 දිනැති අංක SA/AS/AA/Circular දරන සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතු රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කළ උපචිත පදනම මත වූ ගිණුම් 2014 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.4 යහ පාලනය හා ගිණුම්කටයුතු භාවය

---

1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2013 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ඊට අමාත්‍යාංශයේ සියළුම කාර්යයන් ඇතුලත්ව නොතිබුණි.

උදා: ආනයනික ටෙලිනාට්‍ය හා චිත්‍රපට සඳහා බදු අයකිරීම

1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2010 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වසර සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2013 අප්‍රේල් 10 දින දීය.

1.4.3 අභ්‍යන්තර විගණනය

---

2013 වර්ෂයේදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අමාත්‍යාංශය සඳහා විගණන වාර්තා 12 ක් නිකුත් කර තිබුණි. අමාත්‍යාංශයට අතිරේකව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ පුවත්පත් මණ්ඩලයට අදාලව අභ්‍යන්තර විගණන කටයුතු වල යෙදෙන අතර ඊට අතිරේකව ආයතන 10 ක් සම්බන්ධයෙන් අධීක්ෂණය , පසු විපරම් සහ විමර්ශනයන් සිදු කරනු ලැබේ.

1.4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---

2013 වර්ෂය සඳහා අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් , ප්‍රගති සමාලෝචන රැස්වීම් සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 12 කින් එක් ආයතනයක් සඳහා අවස්ථා 02 ක් බැගින්ද, ආයතන 09 ක් සඳහා එක් වතාවක් බැගින්ද පවත්වා තිබූ අතර ආයතන 2 ක් සඳහා රැස්වීම් පවත්වා නොතිබුණි.

1.5 වත්කම් කළමනාකරණය

---

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---

රූපවාහිනී අභ්‍යාස ආයතනය වෙත ලබාදීමට අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කල රු.6,750,000 ක් පිරිවැය වන මෝටර් රථය 2012 පෙබරවාරි 03 දින ඔවුන් වෙත ලබාදී තිබුණි. රූපවාහිනී අභ්‍යාස ආයතනය 2013 වර්ෂයේ සිට රාජ්‍ය සමාගමක් ලෙස ස්ථාපිත කර තිබූ නමුත් 2014 නොවැම්බර් 24 දින දක්වාම එම වාහනයේ අයිතිය ඔවුන් වෙත පවරා නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ශේෂ

---

2006 අංක 11 දරන මුදල් පනතේ 7 වගන්තියට අනුකූලව රූපවාහිනී නාලිකා 02 ක් සම්බන්ධයෙන් ආනයනික චිත්‍රපට , ටෙලිනාට්‍ය හා වාණිජ වැඩ සටහන් වෙනුවෙන් දෙසැම්බර් 31 වන විට අයකල යුතු බදු ආදායම රු. 21,740,500 ක් වර්ෂ 05 කට අධික කාලයක් හිඟව පැවතුණි මෙම හිඟ බදු ආදායම වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 වන විට අයවිය යුතු අධිභාරය රු.9,260,309 ක් විය.

(ඇ) බේරුම් නොකළ බැරකම්

---

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 281,998,775 ක් විය.

1.6 අනුකූල නොවීම්

---

නිති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---

නියැදි විගණන පරික්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල වීධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ---------------------------- | ------------ | ------------------- |
| | රු | |
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------------------- | | |
| (i) මුදල් රෙගුලාසි 104 3 හා 4 ඡේදය | | රන්මිහිතැන්න ටෙලි සිනමා උද්‍යානයේ ගොඩනැගිල්ලක 2011 ඔක්තෝබර් 30 දින ඇති වූ ගිනිගැනීම නිසා වූ අලාභ හානි සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් මූලික පරීක්ෂණයක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645(ඇ) | | එක් එක් ගමන නිමකල වහාම දෛනික ධාවන සටහනේ කළ යුතු සියළුම සටහන් ඇතුලත් කළයුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි. 1646 | | ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2013 වර්ෂය සඳහා වාහන 04 ක ධාවන සටහන් සම්පූර්ණයෙන්ම ද වාහන 13 කට අදාලව මාස 5 සිට 9 දක්වා ධාවන සටහන් එකතුව මාස 91 ක් සඳහා ද 2014 ඔක්තෝබර් 21 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1647(ආ) | | වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයන් සිදුකර ඒ පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ<br>---------------------------- | | |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3:1 ඡේදය | | අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කල හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද වාහන 10 ක් භාවිතාකර තිබුණි. |

1.7 කාර්යසාධනය

---------------

2013 ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

------------------------------------------

ආනයනික ටෙලිනාට්‍ය චිත්‍රපට හා වෙළඳ ප්‍රචාරණ වැඩසටහන් සඳහා බදු අයකිරීමේදී 2006 අංක 11 දරන මුදල් පනතේ 6 නියෝගයට අනුව සම්මානනීය කෘතීන් වැඩිපුර ගෙන්වීමට අනුබලයක් ලෙස එම ටෙලිනාට්‍ය හා චිත්‍රපට ද, ළමයින් හට උචිත විනෝදාස්වාදය ලබා දෙන ළමා චිත්‍රපට හා කාටූන්ද, බදු ආදායමින් නිදහස් කර ඇත. නමුත් මෙම බදු නිදහස ලබාදීමේදී ආනයනික දෑ අධෛර්යමත් කර දේශීය ටෙලිනාට්‍ය හා සිනමා කර්මාන්තය ශ්‍රී ලංකා ගති සිරිත්වලට අනුව නගා සිටුවීම හා ළමා වැඩසටහන් වලදී ළමා මනසට ගෝචර මානසික හා භෞතික වර්ධනයට ඉවහල් වන වැඩසටහන් පෙන්වීම යන පනතේ මූලික අරමුණු පිළිබඳ සැලකිල්ලක් නොදක්වා නිශ්කාශන සහතික ලබාදී තිබුණි. තවද ළමා මනසට සුදුසු නොවන (ප්‍රචණ්ඩත්වයෙන් යුත් දර්ශන ඇති) වැඩසටහන්(කාටූන්) බදු අයකර ප්‍රචාරය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. සුදුසු නොවන ටෙලිනාට්‍ය හා චිත්‍රපට බදු අයකර ප්‍රචාරයට ඉඩදීම පනතේ අරමුණු වලට පටහැනි ගැටළුකාරී තත්වයන් වන අතර මෙහි මූලික පරමාර්ථය ආදායම් ඉපයීම බවට පත්වී ඇති බව නිරීක්ෂණය විය.

උදා:

(i) පහත දැක්වෙන හේතු මත ප්‍රචාරය කිරීම නොයෙක් රටවල් විසින් තහනම් කරන ලද කාටූන්ද පරීක්ෂාවකින් තොරව ළමා කාටූන් ලෙස දක්වා බදු වලින් නිදහස් කර ප්‍රචාරය කිරීමට අනුමැතිය දී ඇත.

| වැඩසටහන | තහනම් කල රට | තහනම් කිරීමට හේතුව |
|---|---|---|
| Sponge bob | China | Particularly aggressive censor objected to the content at his show. |

(ii) ළමා මනසට සුදුසු නොවන ටෙලිනාට්‍ය හා චිත්‍රපට ඕනෑම වෙලාවක විකාශනය කිරීමට අනුමැතිය ලබාදී ඇත.

| නාලිකාව | චිත්‍රපටය/ටෙලි නාට්‍යයේ නම | බදු නිදහස් කිරීමට හේතුව | බදු නිදහස් කර මඩුල්ල විසින් ලබාදී ඇති නිර්දේශය |
|---|---|---|---|
| හිරු ටී.වී | Game Of thrones | සම්මානලාභී චිත්‍රපටයක් වීම. | ඕනෑම වෙලාවක විකාශනය කිරීමට *පහත සඳහන් දර්ශන (Nude scences, sex scences, |

Violence scences) ඉවත්කර අනුමැතිය ලබාදී ඇත.

(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

(i) රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ රූගත කිරීම සඳහා සහභාගී වන අය සඳහා කාමර පහසුකම් සැපයීමට ඒ, බී හා සී ශ්‍රේණියේ කාමර වර්ග තුනක් යටතේ කාමර 43 ක් ඉදිකර ඇති අතර වර්ෂය තුලදී ඒවායේ උපයෝජනය පිළිවලින් සියයට 20, සියයට 22 හා සියයට 61 ක් විය. මෙම උපයෝජනයෙන් වැඩි ප්‍රමාණයක් නොමිලේ පහසුකම් සපයන ඉන්දියානු චිත්‍රපටියක් නිෂ්පාදනය වෙනුවෙන් විය.තවද චිත්‍රපට හා ටෙලිනාට්‍ය සඳහා චිත්‍රාගාරයක් ස්ථාපිත කර තිබුණද 2013 වර්ෂය තුලදී එමගින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ii) රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ දර්ශන තල ප්‍රතිසංස්කරණය, රන්මිහිතැන්න ශාඛාවක් කොළඹ විවෘත කිරීම, සිනමා පාසලක් පිහිටුවීම හා රන්මිහිතැන්න නැවත දියත් කිරීමේ උත්සවය යන කාර්යයන් සඳහා රු.140,000,000 ක ප්‍රතිපාදනයක් වෙන්කරගෙන තිබූ නමුත් 2013 වර්ෂය තුළදී රු.903,052 ක් වැයකර රන්මිහිතැන්න මුළුතැන්ගෙය ප්‍රතිසංස්කරණය කිරීම හැර අනෙකුත් කාර්යයන් ඉටුකර නොතිබුණි**.**

(ඇ) සැලසුම් කිරීම

(i) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකුලව ක්‍රියා නොකිරීම

පහත සඳහන් අවස්ථාවලදි ක්‍රියාකාරී සැලැස්මට අනුකුලව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

- ජනමාධ්‍යවේදීන් 400ක් පුහුණු කිරීම සඳහා වැඩමුළු 08ක් පැවැත්වීම සඳහා රු.4,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2013 වර්ෂය තුළදී මාධ්‍යවේදීන් 100 දෙනෙකු සඳහා එක් වැඩමුළුවක් පමණක් පවත්වා තිබුණි.

- කාලීන ගැටළු පිළිබඳ වාර්තා පලකිරීම සඳහා රු.3,000,000 ක්ද ප්‍රේක්ෂකයා පදනම් කරගත් සමීක්ෂණ සහ අන්තර්ගත විශ්ලේෂණය හා ජාත්‍යන්තර සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රු.3,000,000 ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඉහත ජේදයේ වියදම්ද ඇතුළත්ව වර්ෂය තුළදී රු.9,127,933 ක් වැයකර තිබුණි. කාර්තුමය ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා මෙම ක්‍රියාකාරකම් සඳහා වෙන්කළ ප්‍රතිපාදන කොතෙක් දුරට උපයෝජනය කර තිබේද හා ක්‍රියාත්මක නොකළ වැඩසටහන් මොනවාද යන්න නිශ්චය කළ නොහැකි විය.

- 2013 වාර්ෂික ඇස්තමේන්තු යටතේ අංකන තාක්ෂණය හඳුන්වාදීම, විකාශන සංවර්ධන අධිකාරිය පිහිටුවීම, ජනමාධ්‍ය සම්මාන උළෙල පැවැත්වීම හා ජාතික සංවර්ධනය උදෙසා මාධ්‍ය ප්‍රචාරණ ලබාදීම යන කාර්යයන් සඳහා රු.15,000,000ක

ප්‍රතිපාදන වෙන්කරගෙන තිබූ නමුත් එකී කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, එම ප්‍රතිපාදනයෙන් රු.4,000,000 ක් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ කටයුතු වෙනුවෙන්ද රු.7,630,000 ක් දැයට කිරුල ව්‍යාපෘතිය වෙනුවෙන්ද රු.2,368,000 ක් වෙනත් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද මාරු කර තිබුණි.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ කාර්යයන්

------------------------------------------------------------

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ හා ප්‍රතිපාදන වෙන්කර නොතිබූ නමුත් අමාත්‍ය උපදෙස් මත අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම් විසින් මහනුවර අධ්‍යාපන කොට්ඨාශ තුල පිහිටි පාසල්වල මාධ්‍ය කව දිරිමත් කිරිම සඳහා දැනුවත් කිරීමේ එක් දින සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කර තිබූ අතර වැය කර තිබූ මුදල රු. 196,500 ක් විය.

(iii) කාර්යසාධන වාර්තාවේ අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීම

------------------------------------------------------------

- රූපවාහිනී ගුවන් විදුලි විකාශන වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කොට දක්ෂතා සංචිතයක් ස්ථාපනය කිරීම හා පුහුණු කිරීම යටතේ 152 දෙදෙනෙකු පුහුණු කරන ලද බව දක්වා තිබුණද බඳවා ගැනීම පමණක් සිදුකර තිබුණි.

- ජනමාධ්‍යවේදීන් වෘත්තීමයභාවය ඉහළ නැංවීම අරමුණු කොට ලියාපදිංචි වී ඇති මාධ්‍යවේදීන්ගේ දත්ත ගබඩාවක් නිර්මාණය කරන ලද බව දක්වා තිබුණද එසේ කර නොතිබුණි.

1.8 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු මතභේදාත්මක ස්වරූපයේ ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2013 ජුලි 20 දින රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ප්‍රාදේශීය දේශපාලඥයින් ඇතුලු 40 දෙනෙකු සඳහා දිවා ආහාර සැපයීමට රු. 54,000 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) නියැදියක් ලෙස තෝරාගත් නාලිකා 02 ක් වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනිය යන නාලිකා විසින් පිළිවෙලින් රු13,000,000 ක් සහ රු.9,300,000 ක් ආනයනික වෙළඳ දැන්වීම් සඳහා බදු වශයෙන් අමාත්‍යාංශය වෙත ගෙවූ බව අමාත්‍යාංශයේ ලේඛණ පරීක්ෂා කිරීමේදී අනාවරණය වුවද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ලේඛණ පරීක්ෂාවේදී කිසිදු ගෙවීමක් වෙළඳ දැන්වීම් ප්‍රචාරණය වෙනුවෙන් කර නොතිබුණු බව තහවුරු විය. ඒ අනුව මුදල් නොගෙවූ පුද්ගලයකුගේ නමින් පොදු

172 යටතේ රිසිට්පත් නිකුත් කිරීමෙන් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනයේ ගැටළු සහගත බව නිරීක්ෂණය විය.

1.9 අවිධිමත් ගණුදෙනු

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම

-----------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවන්හි සැපයුම් කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) 2013 දෙසැම්බර් 27 දින හෝටලයක පැවති මාධ්‍ය සුහද හමුව සඳහා ආහාර පාන තැබීමට ඉදිරිපස උද්‍යානය සැකසීම හා විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත පවරා රු. 1,625,000 ක් ගෙවීම.

(ii) රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ වෙබ් අඩවිය ඇතුළු නව අංග එළි දැක්වීමේ උත්සවයේ ඉසව් කළමනාකරණය , ආහාරපාන සැපයීම හා නවාතැන් සැපයීම සඳහා පිළිවෙලින් රු. 6,464,042 , රු. 2,345,600 හා රු. 319,264 ක් පුද්ගලික ආයතන 5 ක් වෙත පවරා ගෙවීම් කිරීම .

(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

----------------------------------------

2009 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍යමණ්ඩල සංදේශයට හා 2009 නොවැම්බර් 12 දිනැති අමප/09/2305/338/048 අමාත්‍යමණ්ඩල පත්‍රිකාව අනුව මෙම බදු ආදායම රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ ඉදිකිරීම් හා ඊට අනුෂාංගික කටයුතු සඳහා වියදම් දැරීමට පමණක් අනුමැතිය ලබාදී තිබුණ අතර, වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කළ මුදලින් වැය නොකළ යුතු සාමාන්‍ය පරිපාලන කටයුතු වන ඉන්ධන, අතිකාල යනාදී වියදම් සඳහා අනුමැතියකින් තොරව මෙම බදු ආදායමින් රු.9,321,367ක් එනම් බදු ආදායමින් සියයට 12 ක් වියදම් දරා තිබුණි.

1.10 හානි හා පාඩු

--------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ ප්‍රවේශපත් අලෙවිය, රූ ගතකිරීම, කාමර පහසුකම් සැලසීම හා වෙනත් ආදායම්වල එකතුව රු. 9,339,337 ක් වූ අතර එහි නඩත්තු හා අනෙකුත් කාර්යයන් සඳහා දරන ලද වියදම රු. 60,942,065 ක් වූයෙන් වර්ෂයේ පාඩුව රු. 51,602,688 ක් විය.

(ආ) බදු මුදල් ගෙවීමකින් තොරව ආනයනික වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන්නේද යන්න පසුවිපරම් කළ යුතු බව විගණනයෙන් කිහිප විටක්ම පෙන්වාදුන් නමුත් පසුවිපරම්

කිරීමක් සිදුකරනු නොලබන බව නිරීක්ෂණය විය. 2013 වර්ෂයේ බදු අයකල ආනයනික වෙළඳ දැන්වීම් සහ සත්‍ය වශයෙන් ප්‍රචාරය වූ ආනයනික වෙළඳ දැන්වීම් පිළිබඳව ආයතන 2ක නියැදියක් ගෙන සිදු කළ පරීක්ෂාවකදී ආනයනික වෙළඳ දැන්වීම් බදු මුදල් ගෙවීමකින් තොරව ප්‍රචාරය කර තිබූ බවත් එම නියැදි ආයතන 2 න් පමණක් රු 2,500,000 ක ආදායමක් රජයට අහිමිවී තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව විශාල ආදායමක් රජයට අහිමිවී තිබිය හැකිබව නිරීක්ෂණය විය.

තවද ආනයනික වෙළඳ දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීමේදී ඒවා දේශීය ගති සිරිත් වලට ගැලපෙන ආකාරයට තිබේද යන්න නිසි අවධානයක් යොමු කර නැති බව නිරීක්ෂණය විය.

උදා: 2013 /2014 වර්ෂයේ විකාශය වන ලක්ස් (soft touch)වෙළඳ දැන්වීම.

## 1.11 අනාර්ථික ගණුදෙනු

---------------------

සමාලෝචිත වර්ෂය තුලදි ගරු අමාත්‍යවරයාගේ විදුලිබිල වශයෙන් එකතුව රු. 2,142,821 ක් ගෙවා තිබූ අතර , මාසික විදුලිබිල රු. 131,313 සිට රු.206,575 ක පරාසයක පැවතුණි.

## 1.12 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

(අ) අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ඡේද වලින් පසු විපරම් කටයුතු නිම නොකළ ඡේද පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව වර්ෂය | ඡේද | යොමුගත විෂයය |
|---|---|---|---|
| (i) | 2012 | 8 (ආ)(ii) | මහින්ද රාජපක්ෂ ටෙලිසිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් ඇති කිරීමට 2012 ක්‍රියාකාරී සැලැස්ම යටතේ සැලසුම් කර තිබුණද, 2014 නොවැම්බර් 20 දින වන විටත් පනතක් සම්මත කර නොතිබුණි. |
| (ii) | 2012 | 12 (අ) | රන්මිහිතැන්නට නිකුත් කළ ප්‍රවේශපත් හා ලැබූ ආදායම අතර නිරීක්ෂණය වී තිබූ රු.99,305 ක ඌනතාවය සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 20 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (iii) | 2012 | 12(ඒ) | 2012 වර්ෂය තුලදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය 2014 නොවැම්බර් 20 දින වන විටත් නිමකර නොතිබුණි. |
| ( iv ) | 2012 | | ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී, ස්ථිර බලපත්‍ර වෙනුවට තාවකාලික බලපත්‍ර නිකුත්කර තිබූ අතර ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීමේ ක්‍රමයක් |

සකස් කර නොතිබුණි. එබැවින් කිසිදු අධීක්ෂණයකින් තොරව නාලිකාවන්හි විකාශන කටයුතු දිගින් දිගටම සිදු කරනු බව නිරීක්ෂණය විය. පසුව නිකුත් කර තිබූ තාවකාලික බලපත්‍රවල, පෙර සඳහන් නොවූ කොන්දේසිද ඇතුළත් කර තිබූ බැවින් ආයතන සම්බන්ධව ඒකාකාරී ලෙස තීරණ ගැනීමට නොහැකියාව හා තීරණ ගැනීමේ ගැටළු මතුවී තිබෙන බව නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයට අදාලව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2014 ජනවාරි 22 දින ලබාදෙන ලද නියෝග අතරින් 2014 නොවැම්බර් 21 දින වන විටත් නිම නොකළ නියෝග පහත දැක්වේ.

| | ගිණුම් කාරක සභා වාර්තාවේ ඡේදයට යොමුව | යොමුගත විෂයය |
|---|---|---|
| (i) | 05 | විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහාද පැමිණිලි කළ හැකි පරිදි ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් පනත සංශෝධනය කිරීම |
| (ii) | 06 | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලික අරමුණක් වන මහජනතාවට ආරක්ෂාව, ආර්ථිකය පිළිබඳව සත්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අදාළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හා ඒ සම්බන්ධව ඇතුළත් වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කිරීම.<br>යන නියෝගය මේ දක්වා සිදුකර නොමැති අතර මහජනතාවට ආරක්ෂාව හා ආර්ථිකය පිළිබඳව සත්‍ය තොරතුරු පහසුවෙන් ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීමට අදාළව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදුකළ යුතු වේ.ලෙස පිළිතුරු ලබාදී ඇත. |
| (iii) | 07,08 | විකාශන සංවර්ධන අධිකාරී පනත සම්මත කිරීම හා පිහිටුවීම, අංකන තාක්ෂණය හඳුන්වා දීම හා ප්‍රගතිය පිළිබඳ කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| (iv) | 12 | රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශවයන් වෙත යෑම වැලැක්වීම සඳහා පෞද්ගලික ගුවන් විදුලි නාලිකා හා රූපවාහිනී නාලිකා බලපත්‍රලාභීන්ගේ ක්‍රියාකාරකම් |

අධීක්ෂණය, වාර්ෂිකව ගාස්තුවක් අයකිරීම හා බලපත්‍ර අළුත් කිරීමට නියමිත ක්‍රමවේදයක් ඇති කිරීම.

| | | |
|---|---|---|
| (v) | 13 | බලපත්‍රලාභීන්ගේ නිවැරදි තොරතුරු අදාළ ආයතන (සමාගම් රෙජිස්ටාර්) වලින් ලබාගෙන කමිටුවට වාර්තාවන් ඉදිරිපත් කිරීම හා කේබල් චන්ද්‍රිකා හා අන්තර්ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇතිකිරීම. |
| (vi) | 15 | 2009, 2010 වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. |
| (vii) | 20 | (i) 2010 සිදුකරන ලද වියදම් වෙනුවෙන් අනුමැතිය ලබාගැනීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීම.<br><br>(ii) ආනයනය කරනු ලබන රූපවාහිනී වැඩසටහන් සඳහා අයකරන බදු ආදායම සඳහා අරමුදලක් ප්‍රමාදයකින් තොරව පිහිටුවීම. |
| (viii) | 26 | ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇතිකිරීම හා රූපවාහිනී ප්‍රචාරණ දැන්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග. |

## 1.13 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේදී බදු ආදායමින් ස්වයංක්‍රීයව පටිගත කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීමේ ප්‍රධාන අරමුණ වූයේ බදු ආදායම රැස්කිරීමට අදාල තොරතුරු අධීක්ෂණය කරගැනීම වුවත්, මේ දක්වා එමගින් කරනු ලබන්නේ ආනයණික රූපවාහිනී චිත්‍රපට හා ටෙලිනාට්‍ය විකාශය විම පරීක්ෂා කිරීම පමණක් වන අතර ඉල්ලුම්නොකරන නමුත් බදු අයවිය යුතු වෙළඳ දැන්වීම් විකාශනය වන්නේද යන්න පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි. එනම් 2013 වර්ෂය තුළදී විකාශනය කිරීම සඳහා අනුමැතිය ලබාදුන් ළමා චිත්‍රපට/කාටූන්වලට අමතරව අනුමැතිය ලබාගැනීමකින් තොරව කාටූන් විකාශනය වූ බව විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. උදාහරණ ලෙස කව්ද බෝයි, ගිරිපුර ඇත්තෝ.

(ආ) 2006 අංක 11 දරන මුදල් පනතේ 6(1) වගන්තියෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලාංකීය ගති සිරිත් වර්ධනය කිරීමේ අදහසින් විදෙස් රටවල නිෂ්පාදනය කරන වැඩසටහන් මෙරට විකාශය කිරීම වෙනුවෙන් බද්දක් පනවා තිබුණි. එසේ වුවද, බලපත්‍ර 15 ක් යටතේ ක්‍රියාත්මක වන කේබල්, චන්ද්‍රිකා, අන්තර්ජාලය හා දුරකථන මත පදනම් වූ රූපවාහිනී

නාලිකා තුළින් විකාශය වන වැඩසටහන් මෙම බද්දට යටත් නොවේ. එබැවින් අදාළ බද්ද පැනවීමේ පරමාර්ථයන් මෙරට තුළ ඉටු නොවන බව නිරීක්ෂණය කෙරේ. තවද, මෙම රැස්කරගන්නා බදු ආදායම බැර කිරිම සඳහා අරමුදලක් පිහිටුවීමට 2009 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ එකඟ වී තිබූ අතර, එය 2013 ජූලි දක්වාම සිදුකර නොතිබුණි.

(ඇ) රාජ්‍ය සංස්ථා 2 කින් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වෙත මුදාහැර ඇති සේවකයන් 12 ක් සඳහා වැටුප් ලෙස රු 4,982,066 ක්ද අතිකාල වශයෙන් රු.2,387,613 ක්ද එම සංස්ථා විසින් ගෙවා තිබු නමුත් අමාත්‍යාංශය විසින් ඔවුන් අනුයුක්ත කරන ලද අංශ පිළිබඳ තොරතුරු, පැමිණීම සනාථ කිරීම්, අතිකාල සේවයේ යෙදුණු බවට තහවුරු කිරීම් කිසිවක් විගණනය වෙත ඉදිරිපත්කිරීමට අපොහොසත් විය. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් හෝ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් නිළධාරීන් අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලෙස ලිපියක් හෝ එකී නිළධාරීන් අමාත්‍යාංශ කාර්යාලයට අනුයුක්ත කරන ලද බව දැන්වීමක් හෝ අමාත්‍යාංශ කාර්යාලයේ ලිපි ගොනුව අනුව නොමැත. මෙවැනි නිළධාරීන් අමාත්‍යාංශ කාර්යාලයේ කුමන අංශයක හෝ සේවයේ යොදවා ද නැත.

1.14 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යා හා සත්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 02 | 00 |
| (ii) තෘතියික මට්ටම | 03 | 01 | 02 | 00 |
| (iii) ද්විතියික මට්ටම | 102 | 74 | 28 | 00 |
| (iv) ප්‍රාථමික මට්ටම | 33 | 31 | 02 | 00 |
| (v)වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 00 | 02 | 00 | 02 |
| එකතුව | 153 | 121 | 34 | 02 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 34 ත් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

-----------------------------------------------------

අමාත්‍යාංශය විසින් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | තනතුර | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| ප්‍රාථමික | රියදුරු | 02 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 2010.08.02 සිට මේ දක්වා |
| -එම- | රියදුරු | 01 | -එම- | 2011.10.03 සිට මේ දක්වා |
| -එම- | කා.කා.ස. | 02 | -එම- | 2010.08.02 සිට මේ දක්වා |
| ප්‍රාථමික | නිෂ්පාදන සහායක කොන්ත්‍රාත් | 01 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 2010.12.01 සිට මේ දක්වා |
| -එම- | කම්කරු- කොන්ත්‍රාත් | 02 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 2011.07.11 සිට මේ දක්වා |
| -එම- | මුද්‍රණ කාර්ය සහායක | 01 | -එම- | 2013.06.03 සිට මේ දක්වා |
| ද්විතියික | කළමනාකරණ සහායක (කොන්ත්‍රාත්) | 01 | -එම- | 2011.06.22 සිට මේ දක්වා |
| | | 01 | | 2011.12.16 සිට මේ දක්වා |
| | | 01 | | 2012.11.01 සිට මේ දක්වා |

## 2. ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

-----------------------------------------------------------

### 2.1 විගණන විෂය පථය

-----------------------

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී.ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගනන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්ව ඇත.එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසදිම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දිමේ නිලධාරියාගේ වගකිම

---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149, 150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරික්ෂණ

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ ) දක්වා වූ පොදු නිරික්ෂණ සහ පහත 2.3 සිට 2.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරික්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛණය | 1978දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පුද්ගල පඩිනඩි ලේඛණය | 2010 පෙබරවාරි 19 දිනැති අංක ඩීඑම්ඡ් /2010 (4) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 453 (2) |
| (iii) | බැරකම් ලේඛණය | මුදල් රෙගුලාසි 211 |

(ආ) විගණන විමසුම් වලට පිළිතුරු දීම

-------------------------------------

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට 2015 ජනවාරි 20 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එම විමසුම් වලට අදාල ගණනය කළහැකි ගණුදෙනුවලට අදාල වටිනාකම රු. 14,419,557 ක් විය.

(ඇ) අයවැය විචලනය

------------------

(i) ප්‍රාග්ධන මිලදී ගැනීම් සඳහා අවස්ථා 9 කදී වැය කර තිබුණු රු. 1,085,876 ක් අදාල වැය විෂයන්ට ඇතුළත් නොකර වෙනත් වැය විෂයන්ට ඇතුළත් කිරීම නිසා නියමිත වැය විෂයන් වල ඉතිරිවීම් ඇති වී තිබුණි. මෙම නිසා ඩී.ජී.එස්.ඒ6 හි දක්වා ඇති ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර ඉතිරිවීම් වලට හේතුවූ කරුණු ලෙස දක්වා තිබුණු පැහැදිලි කිරීම් පිළිගැනීමට නොහැකි විය.

(ii) මු.රෙ.66 මගින් රු. 438,570 ක ප්‍රතිපාදන අදාල ප්‍රාග්ධන වැය විෂයන් අතර මාරුකිරීම් සිදු කිරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර, දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි වැය විෂයන් අතර මාරු කිරීම් සිදුකර තිබුණි.

(iii) වැය විෂයන් දෙකක් යටතේ වෙන්කර තිබුණු එකතුව රු 27,220,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව රු 701,262 ක් සඳහා බැරකම් වලට එළඹී තිබුණි.

(iv) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ එක් එක් වත්කම් යටතේ ආරම්භක, අවසාන ශේෂයන්, ඉවත් කළ හා එකතු කළ වත්කම්වල වටිනාකම සටහන් කරනු වෙනුවට ඒකක සංඛ්‍යාව පමණක් සටහන් කර තිබුණි. වත්කම්වල මුළු වටිනාකම ලෙස රු.467,931,249 ක් දක්වා තිබුණි. පසුගිය වර්ෂ 03ක සිට මෙම වරද පෙන්වා දුන් නමුත් සමාලෝචිත වර්ෂයේදීද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අග්‍රිම ගිණුම

----------------

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 අප්‍රේල් 07 දිනැති ලිපිය ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත්කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු 60,000 ක් දක්වා අනුමත වී තිබුණත්, එම අනුමැතියට පටහැනිව අවස්ථා 2 කදී නිලධාරියකු වෙත රු. 60,000 ක් ඉක්මවූ එකතුව රු. 464,285ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

---------------------------

(i) 2013 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනය සඳහා වියදම් දැරීමට වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද රු.3,141,819 ක මුදලක් තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ අතර, මින් රු.911,994 ක් වර්ෂ 1-2 ත් අතර කාලයට අදාළව ආයතන 3කින් ලැබී තිබුණි.

(ii) 2011 වර්ෂයේදී නව මාධ්‍ය මධ්‍යස්ථානයට හා ඊට සම්බන්ධ අනෙකුත් කාර්යයන් සඳහා ලෙස ප්‍රතිපාදන වලින් රු.මිලියන 45 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. මෙම මුදලින් 2012 වර්ෂය තුළ අදාළ බැඳීම් නිරවුල් කළයුතු බව දක්වා තිබුණද, 2013 වර්ෂයේදී සිදු කර තිබූ පැරණි ශ්‍රවණාගාරයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් මෙම මුදලින් රු.2,231,012 ක් වැය කර තිබුණි.

(iii) පොදු තැන්පත් ලෙජර් ගිණුම් පවත්වාගෙන යාමේ අඩුපාඩු හා අක්‍රමවත්බව මගහරවා තැන්පතු ගිණුම් සාරාංශය විධිමත් අයුරින් පවත්වාගෙන යාම සඳහා උපදෙස් දෙමින් අභ්‍යන්තර විගණන අංශය විසින් 2013 ජනවාරි 15 දින ආකෘති පත්‍රයක් හඳුන්වා දී තිබුණි. මෙම උපදෙස් පිළිපැද නොතිබූ අතර, දිගින් දිගටම ලෙජර් ගිණුම් අක්‍රමවත්ව පවත්වා තිබුණ බැවින් විගණනය කිරීමේ පහසුකම නොමැතිවී තිබුණි.

(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර නොගැනීම.

---

මියගොස් හා සේවය හැරගොස් අවුරුදු 10 කට අධික කාලයක් ගතවී තිබූ නිලධාරීන් 04දෙනෙකුගෙන් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ ණය ශේෂවල වටිනාකම රු.261,272ක් විය. මෙම ණය මුදල් අයකර ගැනීම සම්බන්ධව නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා 2013 ඔක්තෝබර් 03 හා 2014 ජූලි 11 දිනයන්හි ලිපි යොමු කර තිබුණද, 2014 අගෝස්තු 30 දක්වාම ඒ සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(උ) උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීම

---

2013 ජනවාරි 23 දිනැති අංක SA/AS/AA/Circular වන සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතූ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කළ උපචිත පදනම මත වූ ගිණුම් 2014 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම්කටයුතු භාවය

---

### 2.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

ක්‍රියාකාරී සැලැස්මෙහි 4.1.1.2 , 4.5.5.1, 4.5.5.2, හා 4.5.5.3 යන යොමු අංක යටතේ දක්වා තිබූ පරිගණක හා අනෙකුත් උපාංග මිලදී ගැනීම කාර්යාල පිරිසැකැස්ම සකස් කිරීම, පැරණි ශ්‍රවණාගාරය අළුත්වැඩියාව හා කාර්යාල උපකරණ මිලට ගැනීම යන කාර්යන් සඳහා භෞතික හා මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වෙනුවට ප්‍රසම්පාදන සැලැස්ම අනුව යන්න දක්වා තිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කරන ලද රු. 46,950,000 ක් සඳහා පිළියෙල කරණ ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි එක් එක් කාර්යායන් යටතේ භෞතික හා මූල්‍ය තොරතුරු ලබාගත හැකි ලෙස එය පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2010 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වසර සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 26 දින පිළියෙල කර තිබූ නමුත් එය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණ අතර සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණු බැවින් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රසම්පාදන වෙනුවෙන් කාල සටහනක් සකස් වී

නොතිබුණි. සකස් කළ නිළධාරියාගේ අත්සනද යොදා නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව සකස් කර නොතිබුණි.

2.4.3 අභ්‍යන්තර විගණනය
------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශ මගින් සිදුකරනු ලබන අතර, විගණන විමසුම් 12 ක් 2013 වර්ෂය සඳහා නිකුත් කර තිබුණි.

2.4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
------------------------------------------------------

2013 වර්ෂය සඳහා අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සමඟ ඒකාබද්ධව එකක් පමණක් පවත්වා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය
------------------------------

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකොට 2.1% ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින සැපැයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබූ ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601 ක් සමාන රු.මිලියන 102.2) කට 2003 වර්ෂයේ ස්ථානගත කොට ඇති යන්ත්‍ර නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තුවකින් තොරව 2014 නොවැම්බර් දක්වාම පවතී. මෙම ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා 2010 වර්ෂයේ ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ අතර, එහි නිර්දේශය වූයේ ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මගින් අලෙවි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට වුවත් එසේ කටයුතු කර නොතිබුණි.පසුව අමාත්‍යාංශ රැස්වීමකදී එම යන්ත්‍ර රන්මිහිතැන්න සිනමා උද්‍යානයේ කෞතුක භාණ්ඩයක් ලෙස ස්ථානගත කර තැබීමට තීරණය කර ඒ අනුව කටයුතු කරගෙන යන බව විගණනයට දන්වා තිබුණි.

(ii) ඉහත ණය මුදල කොටස් 04 ක් යටතේ ලබාගෙන තිබුණ අතර, ඒ සඳහා 2013 ජූලි25 වන විට ණය මුදලින් ගෙවා ඇති වටිනාකම යූරෝ 404,590 ක් වන අතර, ඒ සඳහා ගෙවා ඇති පොලිය යූරෝ 308,352 කි. ගිවිසුමේ සඳහන් පොලී

අනුපාතය 2.1% ක් වුවද, ඉන් බැහැරව 2000029 හා 2000061 යන ණය වර්ග 02 සඳහා 6.13% බැගින් 2013 ජූලි වන විටත් යූරෝ 172,295 ක් වැඩි අනුපාතයක් යටතේ ගෙවා තිබුණි. (විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව) රජයට සිදුවූ අලාභය(රු.මිලියන 102.2+ ගෙවා ඇති හා ගෙවීමට ඇති පොලිය) සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයක් හඳුනාගැනීම සඳහා මේ වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුව යටතේ පවත්නා රජයේ ප්‍රකාශන කාර්යාංශයේ විකුණුම් ඉන්වොයිසි සැකසීම, පාරිභෝගිකයින්ට තොග හඳුනාගැනීමට පහසුකම් සැලසීම, තොග ලේඛණගත කිරීම පිළිබඳ පරිගණක මෘදුකාංගයක් රු.600,000 ක මුදලක් ගෙවා 2008 වර්ෂය තුළ හඳුන්වා දී තිබූ නමුත්, විකුණුම් ඉන්වොයිසි සැකසීම හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම පරිගණක මෘදුකාංගය 2013 ජූලි වන විටත් භාවිතා කර නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 756 හා ප්‍රකාරව රජයේ ප්‍රකාශන කාර්යාංශයේ පවතින පොත් පිළිබඳ 2012 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2013 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර තිබුණු නමුත් එම වාර්ථාව පිළිගත නොහැකි බව එම අංශයේ ප්‍රධානී විසින් පෙන්වාදී තිබුණි.

(iii) දෙසතිය සඟරාවේ ඉතිරි තොග සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ශේෂ

රු.24,340 ක වටිනාකමැති වසර 07 කටත් වඩා පැරණි විවිධ නියෝජිත ආයතන වලින් ලබාගැනීමට ඇති හිඟ ආදායමක් තිබුණි.

(ඈ) බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 3,561,652 ක් විය.

## 2.6 අනුකූල නොවීම

-------------------------

නිති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරික්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල වීධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | | අතුරු අග්‍රිම ලබාදීම මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් සීමාවිය යුතු බව සඳහන් කර තිබුණද, මාණ්ඩලික නොවන නිලධාරීන් 13කු හට රු 3000 සිට රු 60,000 දක්වා අවස්ථා 45 කදී එකතුව රු1,205,000 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | | දෙන ලද කාර්යයා නිමවූ වහාම පියවිය යුතු වුවත්, ඇමුණුම-02 හි පරිදි නිළධාරීන් 04 ක් රු784,285 වු අග්‍රිම පියවීම සඳහා කාර්යයා නිමවීමෙන් පසු දින 14 සිට දින 89 ක් දක්වා කාලය ගතකර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 454 | | තොග පොත් තුලනය කර ශේෂය ඉදිරියට ගෙන යාමක් සිදුකර නොතිබුණි.දෙසතිය සගරා තොග පොත්වල නිසිපරිදි ඇතුලත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 802(8) | | වාහන මිලයට ගත් දිනය, මිල,අළුත්වැඩියාවන් , නිෂ්කාර්යව පැවැති කාලය ආදී තොරතුරු ඇතුලත් ලේඛණයක් නඩත්තුකර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645(අ) | | වාහන ලොග් පොත් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදි ඒවා අසම්පූර්ණ බව නිරීක්ෂණය විය |
| (vi) මුදල් රෙගුලාසි 1645(ඇ) | | එක් එක් ගමන නිමකල වහාම දෛනික ධාවන සටහනේ කළ යුතු සියළුම සටහන් ඇතුලත් කළයුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි. |

(vii) මුදල් රෙගුලාසි 1647(ආ)

වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයන් සිදුකර ඒ පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1

සියළුම රාජ්‍ය ආයතනවල වාහන ඉන්ධන අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කෙරෙන බවට ගණන්දීමේ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වගබලා ගත යුතු වුවද එපරිදි කටයුතු නොකරන බව නිරීක්ෂණය විය

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව සතු ශබ්දාගාරය අළුත්වැඩියා කළයුතු බව 2006 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අතර, ඒ සඳහා ප්‍රතිපාදන රු.2,550,000 ක් එම වර්ෂයේදීම ලබාගෙන තිබුණි. මෙම ප්‍රතිපාදනයෙන් රු.2,550,000 ක් 2006 වර්ෂයේදී ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණත් එම අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණු අතර 2011 ජූලි මසදී ඉන් රු.311,998 ක් මායිම් තාප්පයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක වියදම් සඳහා වැය කර ඉතිරිය නැවත දෙපාර්තමේන්තුවට ලබාගෙන 2011 වර්ෂයේදී රජයේ ආදායමට බැර කර තිබුණි. මෙම ශබ්දාගාරයේ අළුත්වැඩියාව අත්‍යවශ්‍යයෙන්ම කළයුතු බව හඳුනාගෙන තිබුණද වර්ෂ 07ක් ඉක්ම ගිය පසුද එය සිදුකර නොතිබුණි. නවීන තාක්ෂණ ක්‍රමවේදය හා උපකරණ සඳහා මෙම අලුත්වැඩියාව බලනොපාන බව අධ්‍යක්ෂ ජනරාල් පිළිතුරු ලෙස දන්වා තිබුණද ඩිජිටල් තාක්ෂණ උපකරණ භාවිතා කළද, ඉහත අලුත්වැඩියාවන් අවශ්‍යම බව අදාළ අංශ ප්‍රධානී විසින් විගණනය වෙත දන්වා ඇත.

## 2.8 කාර්යසාධනය

2013 ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

(i) මහජනතාවට අවශ්‍ය රජයේ ප්‍රකාශන ලබා ගැනීමට ස්ථාපනය කර තිබෙන ප්‍රකාශන කාර්යාංශය සඳහා මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය ප්‍රකාශන නොලැබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මූලික අරමුණක් වන රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාමය ඇතුළු ජාතික වැදගත්කමකින් යුත් කාලීන ක්‍රියාකාරකම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම යන අරමුණු ඉටුකිරීමට බාධා ඇතිවී තිබුණි.

(ii) විශේෂ ජාතික වැදගත් අවස්ථාවන් (ලංකාවේ පළමු නිදහස් උත්සවය වැනි) හා සංවර්ධන ව්‍යාපෘතීන් හා වෙනත් ව්‍යාපෘතීන් පිළිබඳ නිෂ්පාදිත කෙටි චිත්‍රපට හා වාර්තා වැඩසටහන් සංරක්ෂණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වලින් එකකි. එහෙත් දෙපාර්තමේන්තුවේ චිත්‍රපට සංරක්ෂණාගාරය වර්ෂ ගණනාවක සිට නවීකරණය සඳහා එම අංශයේ නිලධාරීන් විසින් ඉල්ලුම් කර තිබුණද, 2013 වර්ෂයේදීත් ප්‍රමුඛතාවය ලබාදිය යුතු මෙම කාර්යය ආරම්භකර හෝ නොතිබුණි. සංරක්ෂණාගාරයෙහි පවතින තත්වය නිසි ප්‍රමිතියකට නොමැති බැවින් එහි සේවයෙහි නියුතු නිළධාරියාගේ සෞඛ්‍යට අහිතකර බලපෑම් ඇති වී තිබූ බවත්, රසායනාගාරයකට උචිත ලෙස වායු සමීකරණ යන්ත්‍ර සවිකර නොමැති බැවින් රසායන ද්‍රව්‍යවල බලපෑම මත වායු සමීකරණ යන්ත්‍ර නිතරම අක්‍රිය වීමත් සිදුවන බවත් විගණනයට වාර්තා විය.

(ආ) සැලසුම් කිරීම
-----------------

(i) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම
------------------------------------------------------------

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ පහත සඳහන් කාර්යයන් 2013 වර්ෂය තුළදීත් ඉටුකර නොතිබුණි.

- මාධ්‍යවේදීන් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම.
- චිත්‍රපට සංරක්ෂණාගාරය නවීකරණය.
- ඩේටා කාර්ඩ් යන්ත්‍රය මිලදී ගැනීම.
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීම.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ කාර්යයන්
--------------------------------------------------------------

ප්‍රකාශන වට්ටෝරු ලේඛන පරිගණකගත කිරීම ඉකුත් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි 2012 වර්ෂයේදී ඉටුකළ යුතු කාර්යක් ලෙස රු.මිලියන 0.5 ක ප්‍රතිපාදනයක් යටතේ දක්වා තිබුණි. මෙය එම වසරේ ඉටුකර නොතිබුණු අතර, 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් කර නොතිබුණු අතර, 2014 නොවැම්බර් වන විටත් ප්‍රකාශන වට්ටෝරු ලේඛන පරිගණකගත කිරීම සිදුකර නොතිබුණි.

(iii) කාර්යසාධන වාර්තාවේ අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීම
--------------------------------------------------------------

කාර්යසාධනය පිළිබඳ එහි පවතින ක්‍රියාකාරකම් 65 න් විගණනය සඳහා තෝරාගත් නියදියකට අනුව ක්‍රියාකාරකම් 12 ක තොරතුරු කැඳවූ නමුත් විගණනයට තොරතුරු ලබාදුන් ක්‍රියාකාරකම් 8ක ප්‍රගති වාර්තා හා දෙපාර්තමේන්තුව අමාත්‍යාංශයට ඉදිරිපත්කල කාර්යසාධන වාර්තාවට අනුව එම

ක්‍රියාකාරකම් 8 න් ක්‍රියාකාරකම් 5 කම පහත සඳහන් පරිදි වෙනස්කම් නිරීක්ෂණයවූ අතර ඒ අනුව පාර්ලිමේන්තුවට නිවැරදි නොවන තොරතුරු ඇතුලත් කොට කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර තිබුණු බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| කාර්යසාධන වාර්තාවට යොමුව | විස්තරය | කාර්යසාධන වාර්තාවට අනුව 2013/12/31 දිනට ප්‍රගතිය | 2013/12/31 දිනට ප්‍රගතිය (අංශවලින් ලබාගත් තොරතුරු අනුව) |
|---|---|---|---|
| 11.1.7 | පාසල් සිසුන් සඳහා මාධ්‍ය වැඩමුළු සංවිධානය කිරීම. | 08 | 01 |
| 12.2.2 | පාසල් මාධ්‍ය සමුළු පැවැත්වීම. | 08 | නැත |
| 1.3.3.1 | දෙසතිය සඟරාව මුද්‍රණය | 12 | 11 |
| 1.3.3.3 | තිංගල් සඟරාව මුද්‍රණය | 02 | 01 |
| 1.3.3.4 | මාධ්‍ය නාමාවලිය | 01 | නැත |

## 2.9 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු මතභේදාත්මක ස්වරූපයේ ගණුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

කොළඹ කොටුව පිහිටි රජයේ ප්‍රකාශන අංශයේ ගබඩාව පැවති ගොඩනැගිල්ලේ ඇති බීම හල බාහිර පාර්ශවයකට 2001 වර්ෂයේ සිටම බදු දී තිබුණ ද විදුලි බිල් ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමක් හෝ 2009 වර්ෂයේ සිට වරිපනම් ගාස්තුද 2005 වර්ෂයේ සිට ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු බදු කුලී මුදල් ද නොගෙවා තිබූ නමුත් එම කාලය තුළදී ඔහුට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීමකින් තොරව 2013 ජූනි දක්වාම ආපනශාලාව පවත්වාගෙන යාමට අවස්ථාව සලසා දී තිබුණි. ඒ අනුව 2013 ජූනි වන විට ඔහුගෙන් අයවිය යුතු වටිනාකම රු.4,653,515 ක් වී තිබුණි. ඉන් පසුව මොහුගෙන් මුදල් අයකර ගැනීමේ කාර්ය සඳහා නීතිපති උපදෙස් ඉල්ලා තිබුණද, 2014 නොවැම්බර් දක්වාම මේ සඳහා මුදල් අයකර ගැනීමක් හෝ නඩු පැවරීමක් සිදුවීනොතිබුණි.මෙම මත්පැන් බලපත්‍රය මේ වන විට කවුරුන් විසින් භාවිතා කරන්නේද යන්න හෝ අවලංගු කර තිබේද යන්න පිළිබඳව විගණනයට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

## 2.10 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගණුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

ප්‍රධාන විදුලි රැහැන ඇතිරීම සඳහා අවශ්‍ය කේබලය ප්‍රමාණ පත්‍රයට අනුව විශේෂ ඇණවුමක් මගින් ලබාගෙන උපදේශන සමාගමේ නිර්දේශය මත සැපයිය යුතු බව සඳහන් කර තිබුණද, එම ඇණවුම හෝ මිලදී ගත් ඉන්වොයිසිය හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර,

වෙළඳපලේ පවතින මිලට වඩා අසාමාන්‍ය ලෙස වැඩි මිලක් එනම්, මීටරයක් රු.26,723 ක් ලෙස මීටර් 394 කට (මිල කියුමේ පවතින මීටර් 50 ඉක්මවූ දිග සඳහා ) රු.10,528,862 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඊට අමතරව විශේෂඥ සේවා සහය ලබා මෙම විදුලි රැහැනේ පවතින සත්‍ය දිග මැනීමේදී මීටර් 74ක දිගක් සඳහා රු.1,977,502 ක් වැඩිපුර ගෙවීම් කර ඇති බව තහවුරු විය.

2.11 හානි හා පාඩු

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ හානි හා පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.200,763,112 කට පුද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.196,080,674 ක් ගෙවා තිබුණි. ඉන් රු.6,623,624 ක් වැඩිපුර ගෙවීමක් ලෙස ගෙවීම් සහතික කරන ලද උපදේශක සමාගම පිළිගෙන තිබූ නමුත් ඒ බව අදාළ කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුම් දීමට හෝ එම මුදල නැවත භාණ්ඩාගාරයට යැවීමට හෝ මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) නව මාධ්‍ය මධ්‍යස්ථානයෙහි 700 $m^2$ ක පමණ වපසරියකින් යුතු ශ්‍රවණාගාරය ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි. උපදේශක සමාගම විසින් 2011 නොවැම්බර් 02 දින ගොඩනැඟිල්ල භාරගෙන ගෙවීම් කර මාස 6 ක් ඉක්ම යාමට ප්‍රථම අනාවරණය වූ පහත අඩුපාඩු 2014 නොවැම්බර් 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

(i) ශ්‍රවණාගාරයට විදුලිය සැපයීමේදී 3 core වයර් වෙනුවට අඩු ප්‍රමිතියේ වයර් යොදා තිබීම නිසා විදුලි පද්ධතිය විධිමත්ව හා අවශ්‍ය පරිදි භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ශ්‍රවණාගාරයෙහි රු.11,000,000 ක් වැය කර ස්ථාපිත කර තිබූ වායුසමන පද්ධතිය මගින් එහි විදුලිය සහ ශබ්ද පාලනය සිදුකරණ අංශය සඳහා වායුසමන ක්‍රියාත්මක නොවීම නිසා,එහි ඇති වටිනා උපකරණවල කල්පැවැත්මට බලපා හැකි බව අප පෙන්වා දුන් අතර එය කොන්ත්‍රාත්කරු මගින් නිවැරදි කිරීම වෙනුවට රු 69,238 ක් වැය කර දෙපාර්තමේන්තුව මගින් එම අංශය වායුසමනය කර තිබුණි.

(iii) ශ්‍රවණාගාරයේ වේදිකාව දෙපස ඉදිකර ඇති බැල්කනි 02 න් දකුණුපස බැල්කනියට ප්‍රවිෂ්ඨ වීම සඳහා පඩිපෙලක් නිර්මාණය කර නොතිබුණි.

(iv) ශබ්ද ආවරණය සඳහා බිත්ති නිමකිරීමේදී ප්‍රමිතියෙන් බැහැරව අවිධිමත්ව නිමකිරීම නිසා ශබ්දය ආවරණය නොවන බැවින් අවශ්‍ය අරමුණ ඉටුවී නොතිබුණි.

(v) වේදිකාව දෙපස බිත්ති ප්‍රමිතියෙන් බැහැරව ඉදිකිරීම නිසා 75 $m^2$ ට වැඩි ප්‍රමාණයක් වේයන් කෑමට ලක්ව තිබුණි.

(ඇ) නව ගොඩනැගිල්ලේ හදිසි පිටවීමේ දොරවල්වලට අදාළව කොළඹ මහ නගර සභාවෙන් සහ ප්‍රධාන ගිනි නිවීමේ නිළධාරියකුගේ වාර්තා ලබාගැනීමකින් තොරව හා නිසි ප්‍රමිතියකින් තොරව සකස් කර තිබූ ගිනි ආරක්ෂිත දොරවල් 04 ක් සඳහා උපදේශන ආයතනයේ නිර්දේශ මත රු.410,000 ගෙවා තිබුණි.

(ඈ) 2013 වර්ෂයේදී පරිගණක 16 මිලදී ගැනීමට සැලසුම් කර ටෙන්ඩර් කැඳවා එහිදී ඉදිරිපත් කළ ඒකකයක පලමු අවම මිල වන රු.119,880 ක් ඉදිරිපත් කළ රාජ්‍ය ආයතනයේ මිල පිළිගත හැකි හේතුවක් නොමැතිව 2011 අගෝස්තු 30 දිනැති අංක PED/PMD/Clari/19 චක්‍රෙල්ඛයටද අවධානය යොමු නොකොට ප්‍රතික්ෂේප කොට ඊට වැඩි මිලකට මිලදී ගැනීම හේතුවෙන් පරිගණක 16 ම මිලදී ගැනීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පරිගණක 09 ක් එකක් රු.185,330 කට මිලදී ගැනීම නිසා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වී තිබූ අතර රු.589,050 ක වැඩිපුර ගෙවීමක්ද සිදුකර තිබුණි.

2.12 අනාර්ථික ගණුදෙනු

----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ ) රු.1,950,000 ක් වටිනාකමැති පුස්තකාල පොත් රාක්ක 67ක් එකග වූ ප්‍රමිතියෙන් බැහැරව මිලදීගෙන ඇති නිසා එම රාක්කවල පොත් ඇසිරීමට නොහැකිව අනාර්ථික ලෙස පැවැති බව භෞතික පරීක්ෂාවේදී හෙළිවිය. පසුව පොත් රාක්කවල බර දරාගැනීමට හැකිවන ආකාරයෙන් ආධාරක යොදා තිබුණ අතර, එය කොන්ත්‍රාත්කරු මගින් සිදුකරවා ගැනීම වෙනුවට දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ වියදම් සඳහා ඇස්තමේන්තු කර ඇති මුදලින් රු.60,000 ක් වැයකර වෙනත් ආයතනයක් මගින් මෙම අළුත්වැඩියාව සිදුකර තිබූ නමුත් ඒවා නියමිත ප්‍රමිතයෙන් නොතිබුණි.

(ආ) (i) සෝෆා මිලට ගැනීමේදී ආසන 4 සෝෆා වෙනුවට එම මිලටම (රු.105,600) ආසන 3 සෝෆා ලබාදීම නිසා වැඩිපුර ගෙවා තිබුණු රු.26,400 ක් අඩුකර රඳවාගැනීමේ මුදල් වලින් රු.211,200 ක් අයකර ගත්බව සඳහන් කර තිබුණද, විගණනය විසින් පෙන්වා තිබුණ අඩුපාඩු එනම් මල බැඳීම, පිරිවිතරවල දක්වා තිබුණු ලෙදර් කවර භාවිතා නොකිරීම යනාදී දුර්වලතා සඳහා විසඳුමක් ලබාගෙන නොතිබුණි. (2014 ජූනි 05 දින භෞතිකව පරික්ෂා කිරීමේදී එම සෝෆා ඉරී ගැලවී ඇති බව නිරීක්ෂණය විය).

(ii) ආසන 04 ප්‍රවේශ ශාලා පුටු ((Four seater lobby chair) 46 ක් 1ක් රු.29,500 බැගින් රු.1,357,000 කට සැපයීමට එකඟ වී තිබුණද, ප්‍රමාණ පත්‍රයේ හා පිරිවිතරවලින් බැහැරව ආසන 03 පුටු (Three seater) 09 ක් හා ආසන 02 පුටු ( two seater) 08 ක් පමණක් සපයා තිබුණි. ආසන ( Lobby seat) එකක් කොටස් වශයෙන් සලකා ආසන (seat) 42 කට ගෙවීම් කිරීම හේතුවෙන් රු.973,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) ඉහත අඩුපාඩු සඳහා රඳවාගැනීම් වලින් මුදල් අඩුකරගත් බව සඳහන් කර තිබුණද එම අඩුකර ගැනීම් පුටු ප්‍රමාණය පමණක් පදනම් කර ගෙන ගණනය කර තිබූ අතර පිරිවිතරවලට පටහැනිවීම වෙනුවෙන් සිදුකළ අඩුකර ගැනීම් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද භාණ්ඩ භාරගැනීමට පෙර අදාල භාණ්ඩ පරික්ෂා කර නියමිත ප්‍රමිතයට ඇති බව සනාථකර ගෙනද නොතිබුණි.

(ඇ ) එකඟ වූ මිලට වඩා වැඩි මිලක් එනම් රු 217,800 ක් ගෙවා මිලදීගත් පුස්තකාල පුටු විසිපහක් ප්‍රමිතියෙන් නිපදවා නොතිබීම හා පැවති අඩුපාඩු නිවැරදි කරගත්ත බව සඳහන් කර තිබුණද භෞතික පරික්ෂාවේදී එම නිවැරදි කිරීම නිසි පරිදි සිදු කර නොතිබුණු බව අනාවරණය විය.

## 2.13 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ඡේද පසු විපරම් කටයුතු නිම නොකළ ඡේද වලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | වර්ෂය | ඡේද | යොමුගත විෂයය |
|---|---|---|---|
| (i) | 2012 | 4 (අ) | නව මාධ්‍ය මධ්‍යස්ථානයට ලී බඩු පෞද්ගලික උපදේශණ සමාගමේ සහාය ඇතිව කරන ලද භෞතික විගණන පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි එකග වූ ප්‍රමිතීන්ගෙන් සහ පිරිවිතරවලින් බැහැරව අයිතම් 12 ක් සඳහා රු. 3,522,700 ක් ගෙවීමක්ද එකග වූ පිරිවිතරවලින් බැහැරව රු. 2,568,800 කට සැපයූ භාණ්ඩ වර්ග 03 ක් පාවිච්චි කල නොහැකි තත්වයෙන් පවතින බව නිරීක්ෂණය විය. |
| (ii) | 2012 | 7(ආ)(i) | රු. 200,763,112 කට නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණ අතර අප විසින් ලිඛිතව ඉල්ලා සිටි උප කොන්ත්‍රාත් ලේඛණය, වගකීම් සහතික (විදුලි උපකරණ, වායු සමීකරණ යන්ත්‍ර,ගිණි ආරක්ෂිත දොරවල් ) , තෝරාගත් ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි, සියලුම ටෙන්ඩර්කරුවන්ගේ ලංසු ලියවිලි වල විවෘත නොකල පිටපත්,පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීම සම්බන්ධ ඇතිකරගත් ගිවිසුම, ආදී තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. |
| (iii) | 2012 | 7(ආ)(ii) | රු.23,997,597 ක වියදමක් දරා නව මාධ්‍ය මධ්‍යස්ථානයට පෞද්ගලික ආයතනයක් වෙතින් ලී බඩු මිලදී ගෙන තිබුණ අතර , එම සමාගමේ ලංසු කැඳවීමට අදාල මුල් පිටපත හෝ එහි අනුපිටපත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

(iv) 2012 8(අ) දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් අදාල ආයතනය වෙත රු.195,985,670 ක මුලු මුදලක් ගෙවා ඇති අතර, 2011 ජුනි 08 දින වැඩ සම්පූර්ණ කළ බවට උපදේශන සමාගම සහතිකයක්ද දී තිබුණි. නමුත්, දෙපාර්තමේන්තුව දැනුම් දීමෙන් පසු උපදේශන සමාගම හදුනාගත් අඩුපාඩු අතුරින් නිවැරදි කර තිබුණේ කිහිපයකි. කෙසේ වෙතත් 2012 දෙසැම්බර් 31 දින අවසන් බිල්පත ගෙවා තිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා සත්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 08 | 07 | 00 |
| (ii) තෘතියික මට්ටම | 16 | 06 | 10 | 00 |
| (iii) ද්විතියික මට්ටම | 231 | 187 | 44 | 00 |
| (iv) ප්‍රාථමික මට්ටම | 52 | 50 | 02 | 00 |
| (v)වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 23 | 14 | 09 | 00 |
| එකතුව | 337 | 265 | 72 | 00 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 72 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | කැළණිය විශ්ව විද්‍යාලය | 2010 මැයි 07 සිට |
| අධ්‍යක්ෂ - | 01 | රූපවාහිනී සංස්ථාව | 2010 අගෝස්තු 01 සිට |

(ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

පුරප්පාඩු පැවතියදීත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබුන මානව සම්පත් පිලිබද විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| (i) මාධ්‍ය විමර්ශන නිලධාරී | 01 | නැවත පදිංචි කිරිමේ අමාත්‍යාංශය | 2013 ජනවාරි 01 සිට |
| (ii) ඡායාරූප ශිල්පි | 01 | ජනාධිපති කාර්යාලය | 2006 ජනවාරි 13 සිට |
| (iii) ව්‍යාපෘති ක්‍රියාකිරීමේ සහකාර | 01 | උද්භිත උද්‍යාන හා පොදු විනෝද්මක කටයුතු පිළිබද අමාත්‍යාංශය | 2013 අප්‍රේල් 22 සිට |
| (iv) ව්‍යාපෘති ක්‍රියාකිරීමේ සහකාර | 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2013 අප්‍රේල් 22 සිට |

පුරප්පාඩු 72 ක් පැවතියදී ඉහත පරිදි දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 04 දෙනෙකු වෙනත් අමාත්‍යාංශ වලට මුදාහැර තිබුණු අතර, ඔවුන් සඳහා වැටුප් හා දීමනා වශයෙන් 2013 වර්ෂයේදී රු.1,481,294 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.